[අන්තර්ජාල අනුවාදයකි]

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 10 දරන කැස්බෑව සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1999 අප්‍රේල් මස 09 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 අප්‍රේල් මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ රු.6.75 යි තැපැල් ගාස්තුව රු.3.50 යි.

[සහතිකය සටහන් කළේ 1999 අප්‍රේල් මස 09 වැන දින.]

**කැස්බෑව සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

එල්.ඩී. - ඕ. 30/94

"කැස්බෑව සංවර්ධන පදනම" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එහි පරමාර්ථ සහ ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා, මෙතෙක් කල් ශ්‍රී ලංකාවෙහි පිහිටුවා තිබූ හෙයින් ද; පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල්, එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටුකර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 1999 අංක 10 දරන කැස්බෑව සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) කැස්බෑව සංවර්ධන පදනමෙහි දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "කැස්බෑව සංවර්ධන පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතුය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. කැස්බෑව සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

**2.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:- සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකාව තුළ ප්‍රජා සුභසාධන, සංස්කෘතික සහ සමාජ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීමෙහි ලා නිරතවීම;

H -022545

(ආ) ශ්‍රී ලංකාව තුළ සංවර්ධනය කිරීමට හේතුවන මාර්ග සංවර්ධනය සහ නිවාස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම, ආරෝග්‍ය ශාලා, අධ්‍යාපන මධ්‍යස්ථාන, පාසැල්, ප්‍රජා මධ්‍යස්ථාන සහ එවැනි වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම හා වැඩි දියුණු කිරීම සහ වෙනත් කටයුතු ක්‍රියාත්මක කිරීම;

(ඇ) දිළිඳු දරුවන්ට යම් වෙළෙඳාමක, රක්ෂාවකට හෝ සේවයකට සූදානම් වීමේ, ඇතුළත්වීමේ හෝ නිරතවීමේ අවස්ථා සැලසීම සහ ඔවුන්ට ඇඳුම් පැළඳුම්, අධ්‍යාපනය හෝ වෙනත්, පහසුකම් සැලසීම;

(ඈ) අධ්‍යාපනය සහ දැනුම වැඩිදියුණු කිරීම, ව්‍යාප්ත කිරීම සහ ප්‍රචාරය කිරීම සඳහා ශිෂ්‍යාධාර, ශිෂ්‍යත්ව, ත්‍යාග, පරිත්‍යාග මූල්‍යාධාර සහ වෙනත් ආකාරයෙන් වූ ආධාර සැලසීම සහ පාසැල් පුස්තකාල සහ සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම;

(ඉ) යම් කර්මාන්තයක හෝ වෙළෙඳාමක නැතහොත් යම් අපනයනය හෝ ආනයන ව්‍යාපාරයක නිරතවීම සහ කෘෂිකාර්මික, කාර්මික සහ වානිජ ව්‍යාපාරයක සහ විශේෂයෙන්, ධීවර කර්මාන්තය, කොහු, සුදු කොහු, කොහු නිෂ්පාදන අපනයන කිරීම වැනි කර්මාන්ත ආරම්භ කොට පවත්වාගෙ යාමට තැනැත්තන්ට ආධාර දීම සහ සහාය වීම සහ තාක්ෂණය සහ ශිල්ප ක්‍රම ජනතාවට සාර්ථක ලෙස ලබාදීම සඳහා පුහුණු කිරීමේ වැඩ සටහන් සහ ව්‍යාපෘති සේවාවන් සහ ප්‍රචාරක කටයුතු සංවිධානය කිරීම;

(ඊ) සංස්ථාවේ පර්මාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ වෙනත් යම් විදේශීය හෝ දේශීය ආයතනයක් හෝ සංවිධානයක් සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම හෝ සහභාගී වීම;

(උ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් ස්ථානයක දී සම්මේලන, සම්මන්ත්‍රණ, වැඩමුළු, සමූහ අධ්‍යාපන සහ දේශනා සඳහා අනුග්‍රහය දැක්වීම සහ ඒවා පවත්වාගෙන යාම;

(ඌ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා යෝග්‍ය යයි සංස්ථාව විසින් සලකනු ලබන පොත්, වාර සඟරා, පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර සහ සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ බෙදා හැරීම;

(එ) සංස්ථාවේ සියලු පරමාර්ථ හෝ ඉන් කිසිවක් මුදුන්පත් කර ගැනීමට අවශ්‍ය, ආනුෂංගික හෝ හිතකර වෙනත් යම් ක්‍රියා සහ දේ ඉටු කිරීම.

4. (1) සංස්ථාවේ කළමනාකරණය, පාලනය සහ පරිපාලනය සංස්ථාවේ සාමාජිකයන් අතුරින් සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලැබූ පාලකවරයන් සංඛ්‍යාවකගෙන් සමන්විත (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන පාලක සභාවක් වෙත පැවරේ. සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව වූ දිනයේ දී, මෙහි උපලේඛනයෙහි නම සඳහන්ව ඇත්තා වූ සාමාජිකයන්ගෙන් සමන්විත පදනමෙහි පාලක සභාව සංස්ථාවේ ප්‍රථම සභාව විය යුතුය.

(3.) (1) වන උප වගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, ස්වකීය ධුරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් මිස ගාමිණී ලොකුගේ මහතා යාවජීව වශයෙන් සංස්ථාවේ සභාපති ධුරය දැරිය යුතුය.

5. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පොරතුව ම වූ දිනයේ දී පදනමෙහි සාමාජිකයකු වූ සෑම තැනැත්තෙකුගේම සහ ඉන් පසු සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කරගනු ලබන සෑම තැනැත්තකුගේම නම ඇතුළත් කළයුතු සාමාජික නාමලේඛනයක් පවත්වාගෙන යාමට පාලක සභාව විසින් සැලැස්විය යුතු ය. සාමාජික නාමලේඛනය.

6. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව - දේපළ අත්කර ගැනීම, අරමුදල් ආයෝජනය කිරීම සහ ණය ගැනීම යනාදිය පිළිබඳ සංස්ථාවේ බලතල

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීම, අත්කර ගැනීමට, කුලියට ගැනීමට, ඉදිකිරීමට හා අන්‍යාකාරයෙන් ලබා ගැනීමට;

(ආ) සංස්ථාවේ කාර්ය සඳහා මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගණුදෙනු කළහැකි සාධන පත්‍ර සෑදීමට,ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට ගණුදෙනු කිරීමට මිලට ගැනීමට, විකිණීමට, නිකුත් කිරීමට සහ බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ වසා දැමීමට;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් සභාව විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට;

(ඉ) දායක මුදල්, සම්මාදම්, ප්‍රදානයන්, පරිත්‍යාග සහ සියලු වර්ගවල ත්‍යාග, ඉල්ලා සිටීමට සහ භාර ගැනීමට;

(ඊ) යම් තැනැත්තකු, යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීමට;

(උ) යම් ස්ථාවර දේපළකට හෝ පෞද්ගලික දේපළකට බලපාන කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට ක්‍රියාත්මක කිරීමට ,ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට;

(ඌ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහකිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීමට;

(එ) සංස්ථාවේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි සේවක පිරිස් පුහුණු කිරීමට ; හා

(ඒ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූල වෙනත් සියලු දේ කිරීමට;

සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ රීති

7. (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කළ සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) සභාව තෝරා පත් කර ගැනීම, සභාවේ නිලධරයන් ධුර අත්හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ සභාවේ නිලතල කාර්ය සහ චර්යාව;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් හා සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය, කර්තව්‍ය සහ චර්යාව;

(ඈ) සභාවේ, සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, එම රැස්වීම්වලදී පූරප්පාඩු පිරවීම, දැන්වීම් සහ න්‍යාය පත්‍ර, රැස්වීම් පිළිබඳ ගණපූරණය සහ එහි දී කටයුතු කරගෙන යාම;

(ඉ) සභාවේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති පදනමේ රීති, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම රීති මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකිය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

8. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්ථවරණ පැවරීම්, පරිත්‍යාග. සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන සභාව විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතුය. සංස්ථාවේ අරමුදල.

(2) මෙම පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**9.** (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව ගිණුම් නිසි අයුරින් තැබීමට පදනම විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සෑම වර්ෂයක දී ම යටත් පිරිසෙයින් එක් වරක් සංස්ථාවේ ගිණුම් පරීක්ෂා කොට විගණනය කළ යුතු ය.

පදනම විසින් සහ පදනමට ගෙවිය යුතු ණය.

**10.** මේ පනත ක්‍රියාත්මක වන දිනට පොරාතුව ම වූ දිනයෙහි පදනමෙහි පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර එදිනට පදනමට ගෙවිය යුතු සියලු ණය, සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**11.** මිලට ගැනීමේ, ප්‍රදානය කිරීමේ. ත්‍යාග කිරීමේ හෝ බදු දීමේ යම් සාධන පත්‍රයක් මත හෝ එවැන්නක් ප්‍රකාර හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් මත හෝ එවැන්නක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ ලැබෙන චංචල හෝ නිශ්චල සියලු දේපළ අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය ඇති අතර, එවැනි සියලු දේපළ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට සහ භාරවලට යටත්ව ද අදාළ සාධන පත්‍රවල හෝ දේපළ බැහැර කිරීමේ අන්තිම කැමති පත්‍රයේ විධිවිධාන වලට හා කොන්දේසිවලට යටත්ව ද (ඒ බලතල සහ භාරවලට අදාළ යම් ලිඛිත නීතියක විධිවිධානවලට අදාළ සාධන පත්‍රය හෝ දේපළ බැහැර කිරීමේ අන්තිම කැමති පත්‍රයේ විධිවිධානවලට යටත්ව) විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ හුවමාරු කිරීමේ, බැඳ තැබීමේ හෝ යටත් කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**12.** සභාවේ සාමාජිකයකු සහ ලේකම්වරයා හෝ සභාව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර වූ යම් සාධන පත්‍රයකට නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමාකිරීම.

**13.** සංස්ථාවේ කිසිම සාමාජිකයෙක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු ග්‍රාහක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් සාමාජික මුදලක් ගෙවීමට යටතේ නොවන්නේ ය.

14. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර වූ හෝ දේපළක් ඉතිරි වුවහොත් ඒ බැරකම් සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදාදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතුය.

විසුරුවා හැරීමේදී ඉතිරිවන දේපළ.

15. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින් ඔවුන්ගෙන් සහ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

16. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

උපලේඛනය [4 (2) වන වගන්තිය]

සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල්

ගාමිණී ලොකුගේ මහතා

උප සභාපතිවරු

සිරිනාල් ද මෙල් මහතා
එම්.සැම්සන් සිල්වා මහතා
ටී.ඒ.ඩී. ආරියදාස මහතා
එල්.ඒ. වනිගසූරිය මහතා
සිරිනිමල් කත්‍රිආරච්චි මහතා

ලේකම්

චන්ද්‍රා ජයසිංහ මහතා

උප ලේකම්වරු

ඩී.විලියම් ආටිගල මහතා
මහින්ද කුමාර විජේරත්න මහතා

භාණ්ඩාගාරික

ලලිත් වික්‍රමසිංහ මහතා

කාරක සභිකයින්

විමල් වික්‍රමරත්න මහතා
සිසිර ජයවර්ධන මහතා
ඇල්ප්‍රඩ් සමරකෝන් මහතා
විමලසේන ජයවීර මහතා
බී.එල් ඩබ්ලිව්. කුමාරගේ මහතා
ආනන්ද සරත්කුමාර ජයසිංහ මහතා
නන්දසේන අමරසිංහ මහතා
ප්‍රේමවර්ධන අබේරත්න මහතා
අශෝක පරණවිතාන මහතා
රණසිංහ කල්දේරා මහතා
බර්නාඩ් රම්‍යකුමාර ද කොස්තා මහතා
කේ.කේ. සෝමතිලක මහතා
එස්.වීරසිංහ මහතා
ලොයිඩ් පෙරේරා මහතා
ඒ.ඒ.ඩී. උබේසිරි මහතා
ඩී.විජේතුංග මහතා
එන්.එච්. පෙරේරා මහතා
කල්කි පතිරාජ මහතා
ඩී.එම්. ලොකුගේ මහතා
දර්ශි ලොකුගේ මෙනවිය
ගයාති ලොකුගේ මෙනවිය
නිමල් මුණසිංහ මහතා

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.